සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Sabaragamuwa Provincial Department of Education**
சபரகமுவ மாகாணக் கல்வி திணைக்களம்

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය -2026
## තෙවන වාර පරීක්ෂණය

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

23 | S | I

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

පැය දෙකයි
இரண்டு மணி நேரம்
Two Hours

විභාග අංකය.........................................

උපදෙස් :
* මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් දෙකකින් සමන්විත ය.
* **A** කොටස බහුවරණ ප්‍රශ්න 30කින් හා **B** කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20කින් යුක්ත වේ.
* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100 කි.

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 01 | |
| 2 | 02 - 07 | |
| 3 | 08 - 13 | |
| 4 | 14 - 19 | |
| 5 | 20 - 24 | |
| 6 | 25 - 30 | |
| 7 | 31 - 39 | |
| 8 | 40 - 50 | |
| එකතුව | | |

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## A කොටස

- අංක **1** සිට **20** තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත්** ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

1. දේශපාලන විද්‍යාවට අයත් අංගයක් වන්නේ,
   (1). මානව සමාජ පරිණාමය
   (2). දේව ධර්ම ශාස්ත්‍රය
   (3). සමාජ සංවිධානවල ව්‍යුහය
   (4). මානව සමාජ සම්බන්ධතා
   (5). ජාතීන්ගේ බාහිර සබඳතා

(......)

[දෙවැනි පිටුව බලන්න]

Past Papers Wiki

2. "දේශපාලන අධ්‍යයනයේ අරමුණ විය යුත්තේ දේශපාලන ප්‍රපංච යනු මොනවාදැ'යි විස්තර කිරීම පමණක් නොව දේශපාලන ආයතන සහ ප්‍රායෝගික භාවිත කෙසේ සකස් විය යුතු දැයි යෝජනා කිරීමයි". මෙම ලක්ෂණයන්ට අදාළ දේශපාලන විද්‍යා අධ්‍යයන ක්‍රමය වන්නේ කුමක්ද?
   (1). තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශය
   (2). බහු විෂයක අධ්‍යයන ප්‍රවේශය
   (3). දාර්ශනික ප්‍රතිමානීය අධ්‍යයන ප්‍රවේශය
   (4). චර්යාවාදී අධ්‍යයන ප්‍රවේශය
   (5). දේශපාලන අර්ථ ශාස්ත්‍රීය අධ්‍යයන ප්‍රවේශය (......)

3. දේශපාලනය,
   (1). මිනිස් ජීවිතයේ ආරම්භය, පැවැත්ම සහ අවසානය අතර සම්බන්ධය වේ.
   (2). ධනය, බලය සහ සම්පත් බෙදා හැරීමට සම්බන්ධ ක්‍රියාවලියක් වේ.
   (3). දර්ශනය, චින්තනය, න්‍යාය සහ මතවාද යන අංගවලින් සමන්විත වේ.
   (4). දේශපාලන විද්‍යාවේ න්‍යායාත්මක පැතිකඩ වේ.
   (5). සමාජ, ආර්ථික සහ දේශපාලන ගැටළු පිළිබඳව එකඟතාවයන්හි ප්‍රතිඵලය වේ. (......)

4. ආණ්ඩුව
   (1). පොදු ක්ෂේත්‍රයට අයත් සියලුම ආයතන ඇතුළත් සංගමයක් වේ.
   (2). සමාජය පාලනය කරන සියලු බල ව්‍යුහවල ඓක්‍යය වේ.
   (3). තමන්ගේම බලයක් භාවිතා කරන උත්තරීතර ආයතනය වේ.
   (4). ජාතීන් අතර පවතින්නා වූ දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාධරයා වේ.
   (5). නූතන රාජ්‍යයන්හි අභිනියෝජිත බලයකින් යුක්ත වේ. (......)

5. ඒකීය ආණ්ඩු ක්‍රමය,
   (1). ආණ්ඩු මට්ටම් අතර දේශපාලන බලය සම්බන්ධීකරණය කරයි.
   (2). මධ්‍ය හා පරිධිය අතර බල හවුල්කාරීත්වයක් ඇති කරයි.
   (3). සමාජ බහුවිධතාවය ආරක්ෂා කරමින් ඒකීයත්වය ඇති කරයි.
   (4). සංවරණය නොවූ මධ්‍යගතකරණයක් නිර්මාණය කරයි.
   (5). කාර්යක්ෂමතාවය සහ ප්‍රජාතන්ත්‍රවාදය ඉහළ නංවයි. (......)

6. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක ලක්ෂණයක් වන්නේ කුමක්ද?
   (1). විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර විධිමත් පුද්ගල බෙදීමක් පවතී.
   (2). රාජ්‍යයේ නායකයා ආණ්ඩුවේ නායකයා නොවේ.
   (3). රාජ්‍යයේ නායකයා ඍජුව ජනතාව විසින් තෝරාපත් කරගනු ලබයි.
   (4). බලතල බෙදීමේ සිද්ධාන්තය පදනම් කරගෙන ක්‍රියාත්මක වේ.
   (5). බහු පක්ෂ ක්‍රමයක් තුළ වඩාත් සාර්ථකව ක්‍රියාත්මක වේ. (......)

7. තුන්වන ලෝකයේ සමාජවාදය ඉදිරිපත් තළ ප්‍රධාන ප්‍රකාශකයෙක් වන්නේ,
   (1). කාල් මාක්ස්
   (2). ෆෙඩ්‍රික් එංගල්ස්
   (3). අබ්දුල් ගමාල් නසාර්
   (4). ඩී.එස්.සේනානායක
   (5). ඇඩම් ස්මිත් (......)

[තුන්වැනි පිටුව බලන්න]

8. පහත සඳහන් දේශපාලන මතවාද අතුරින් එක් දේශපාලන මතවාදයක් නිවැරදි ව විස්තර වේ. නිවැරදි ව දැක්වෙන දේශපාලන මතවාදය තෝරන්න.

| | | |
|---|---|---|
| (1) ලිබරල්වාදය | - | නිෂ්පාදන මාධ්‍යවල පොදු අයිතියට ඉඩ ලබා දේ. |
| (2) සමාජවාදය | - | පෞද්ගලික දේපළ ක්‍රමය සහ නිෂ්පාදන මාර්ගවල පෞද්ගලික අයිතියට ඉඩ ලබා දේ. |
| (3) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය | - | විප්ලවීය සමාජ පරිවර්තනයන් අනුමත කරයි. |
| (4) ස්ත්‍රීවාදය | - | රාජ්‍යයේ ආරම්භය, පැවැත්ම සම්බන්ධ විශේෂ න්‍යායක් වේ. |
| (5) ජාතිකවාදය | - | පොදුබව පිළිබඳ හැඟීමෙන් ආරම්භ වී පසුව දේශපාලන ස්වරූපයකට ගමන් කරයි. |

(......)

9. ගැටුමක ප්‍රචණ්ඩත්වය, විනාශකාරී ප්‍රතිඵල පාලනය කර එහි ව්‍යාප්තිය පාලනය කරන මාධ්‍ය වන්නේ කුමක්ද?

(1). ගැටුම් කළමනාකරණය
(2). ගැටුම් වැළැක්වීම
(3). ගැටුම් පරිවර්තනය
(4). ගැටුම් කල් තබා අනතුරු ඇඟවීම
(5). ගැටුම් සමථනය (......)

10. මානව අයිතිවාසිකම්,

(1). බැඳීම් යන පදයෙන් විස්තර කරන්නක් වේ.
(2). මූලික නීතිය මඟින් තහවුරු කරන හිමිකම් වේ.
(3). රාජ්‍යයෙන් රාජ්‍යයට වෙනස් වේ.
(4). මානව අභිමානය තහවුරු කරන්නක් වේ.
(5). ජොන් ලොක් විසින් නිර්මාණය කරන ලද්දක් වේ. (......)

11. අන්තර්ජාතික දේශපාලනය,

(1). නූතනයේ පූර්ණ අරාජික තත්ත්වයක් පෙන්නුම් කරයි.
(2). විශ්වීය නීති පද්ධතියක් මගින් පාලනයට ලක් කරයි.
(3). නිරන්තරයෙන් ඡන්ද විමසීම් මගින් තීරණ ගැනීම සිදු කරයි.
(4). ඇමරිකා එක්සත් ජනපදය සහ චීනය විසින් සම්පූර්ණයෙන්ම පාලනය කරයි.
(5). ජාතික අභිලාෂ ඉටු කර ගැනීමට ජාතික රාජ්‍යයන් ජාතික බලය යොදවයි. (......)

12. දේශපාලන පක්ෂ,

(1). ජනතාව විසින් ලබාදෙන සුජාත බලයකට හිමිකම් නොකියන සංවිධාන විශේෂයක් වේ.
(2). රාජ්‍යයෙන් පරිබාහිරව ක්‍රියාත්මක වන සමාජ සංවිධාන වේ.
(3). ආණ්ඩුවෙන් පිටත සිට ප්‍රතිපත්ති සම්පාදනයට හවුල් වේ.
(4). සමාජ, ආර්ථික සහ දේශපාලනමය ප්‍රතිපත්ති රාමුවකින් යුක්ත වේ.
(5). මැතිවරණ හරහා පමණක් ජනතා කැමැත්ත උරගා බලන සංවිධාන විශේෂයක් වේ. (......)

13. නූතන ජාතික රාජ්‍යයන්හි ලක්ෂණයක් වන්නේ,

(1). පරමාධිපත්‍ය බලය හිමි එකම සංවිධාන විශේෂය වේ.
(2). නම්‍යශීලී දේශ සීමාවන්ගෙන් යුක්ත වේ.
(3). ජ්‍යෙෂ්ඨත්වය මත පාලකයන් පත් වේ.
(4). වගකීම ඉටුකිරීමට පමණක් බැඳී සිටින පුරවැසියන්ගෙන් යුක්ත වේ.
(5). ධනවාදී සමාජ ක්‍රමය බිඳ වැටීමෙන් පසුව බිහි වූ ඒවා වේ. (......)

[හතරවැනි පිටුව බලන්න]

14. අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන යනු,
   (1). රාජ්‍යයන්ගේ දේශසීමා විනිවිද යමින් ක්‍රියා කරන ගෝලීය මට්ටමේ ව්‍යාපාර සංවිධාන වේ.
   (2). විශේෂිත අරමුණක් හෝ අරමුණු කිහිපයක් ඉටු කර ගැනීමට ක්‍රියා කරන රාජ්‍යයෙන් ස්වාධීනව ගොඩනගන ලද සංවිධාන වේ.
   (3). රාජ්‍යයන්ගේ දේශසීමා විනිවිද යමින් ආරක්ෂක පද්ධති අභියෝගයට ලක් කරන සංවිධාන ජාලාවක් වේ.
   (4). එකම භූගෝලීය කලාපයක පිහිටි සමාජ, ආර්ථික, දේශපාලන සංවර්ධනය ඉලක්ක කර ගත් සංවිධාන වේ.
   (5). රාජ්‍යයන්ගේ ආර්ථික බිඳ වැටීම්වලදී ණය හා ආධාර සපයමින් ක්‍රියා කරන මහා පරිමාණ මූල්‍ය සමාගම් වේ. (......)

15. පස්වන නොබැඳි සමුළුව ශ්‍රී ලංකාවේ පවත්වන අවස්ථාවේ මෙරට පැවැති ආණ්ඩුව කුමක්ද?
   (1). මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව (1956 – 1960)
   (2). එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව (1965 – 1970)
   (3). සමගි පෙරමුණ ආණ්ඩුව (1970 – 1977)
   (4). පොදුජන එක්සත් පෙරමුණ ආණ්ඩුව (1994 – 2000)
   (5). එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව (2010 – 2015) (......)

16. සමූහාණ්ඩුවාදය,
   (1). රාජාණ්ඩුවාදයේ පරම ආදර්ශය වේ.
   (2). පරමාධිපත්‍ය බලයේ හිමිකරුවා පාලකයා වේ.
   (3). ලිබරල්වාදයට එකහෙලා විරුද්ධ වේ.
   (4). සක්‍රිය පුරවැසිභාවය ප්‍රමුඛ ලක්ෂණයක් වේ.
   (5). දේශපාලන ආධිපත්‍ය මත නිදහස ඇති වේ. (......)

17. පහත සඳහන් රටවල් පහේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක්ද?
   (1). ප්‍රංශයේ දේශපාලන බලය උපජාතික ආණ්ඩු තල තුනකට විමධ්‍යගත කර ඇත.
   (2). ස්විට්සර්ලන්තයේ ඉහළ සිට පහළට ගමන් කරන බල සහයෝගීතා ක්‍රමයක් දක්නට ඇත.
   (3). ඉන්දියාව තුළ මධ්‍යම ආණ්ඩුව විසින් බලය අවධාරිත කළ ප්‍රාන්ත ක්‍රමයක් දක්නට ඇත.
   (4). ඇමරිකා එක්සත් ජනපදයෙහි මධ්‍යම ආණ්ඩුවත්, ප්‍රාන්ත ආණ්ඩුත් හවුලේ භුක්ති විඳින සමගාමී බලතල ඇත.
   (5). එක්සත් රාජධානිය තුළ සමමිතික බල බෙදීමක් දක්නට ඇත. (......)

18. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමයේ අවධියක් වන්නේ,
   (1). ප්‍රතිපත්ති විශ්ලේෂණය
   (2). ප්‍රතිපත්ති ඇවර කිරීම
   (3). ප්‍රතිපත්ති උපදේශනය
   (4). ප්‍රතිපත්ති නායකත්වය
   (5). ශ්‍රම විභජනය (......)

19. නීතියේ ආධිපත්‍යයෙන් අදහස් වන්නේ,
   (1). ආණ්ඩුවේ පාලන කටයුතුවලට සම්බන්ධ වන්නන් නීතියට පහළින් නොව නීතියට ඉහළින් සිටිය යුතුය.
   (2). නීතියේ පාලනය නොව මිනිසුන්ගේ පාලනය ඇති කිරීමට ක්‍රියා කිරීමයි.
   (3). ආණ්ඩුවට ඇති බලය නෛතික සංවරණයක් මගින් සීමා නොවිය යුතුය.
   (4). රාජ්‍යයක පුරවැසියන් සාමාන්‍ය නීතියට පමණක් යටත් විය යුතුය.
   (5). ව්‍යවස්ථාදායක, විධායක අයුතු බලපෑම්වලින් තොර අධිකරණයක් ඇති කළ යුතුය. (......)

[පස්වැනි පිටුව බලන්න]

20. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ නව ප්‍රවනතාවයක් වන්නේ,
(1). වාර්ගික සහ ආගමික දේශපාලන පක්ෂවල ශක්තිය ඉහළ යාම.
(2). ද්වි සහාග ආණ්ඩු බිහිවීම සුලභ වීම.
(3). දේශපාලන අවස්ථාවාදය මත පක්ෂවලට පෙළ ගැසීම.
(4). දේශපාලන පක්ෂ ක්‍රමය වඩාත් ස්ථාවර වීම.
(5). දේශපාලන පක්ෂවල මතවාදී ස්ථාවරයන් නොවෙනස් ව පැවතීම (......)

- අංක **21** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරන්න.

21. බ්‍රිතාන්‍ය පාලන අවධියෙහි ලංකාව තුළ,
A - ලාංකිකයන්ට සිවිල් සේවයට ඇතුළු වීමට ඉඩ සපයනු ලැබීය.
B - උඩරට හා පහතරට ඒකාබද්ධ කර ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස නම් කරනු ලැබීය.
C - බටහිර යුරෝපයේ පැවති ලිබරල් ආයතන ලංකාවට හඳුන්වා දෙනු ලැබීය.
D - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ වර්ධනයට දොරගුළු විවෘත කරනු ලැබීය.
E - වෙළඳ භාණ්ඩ සඳහා අය කරන තීරු බදු අඩු කරනු ලැබීය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

22. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය මගින්,
A - සාමූහික වගකීම සහිත අමාත්‍ය මණ්ඩලයක් ඇති කරනු ලැබීය.
B - නිර්බාදවාදී රාජ්‍ය ක්‍රමය සුභසාධන රාජ්‍ය ක්‍රමයකට පරිවර්තනය කරනු ලැබීය.
C - වාර්ගික නියෝජන ක්‍රමය සුළුතර නියෝජනයක් දක්වා වෙනස් කරනු ලැබීය.
D - ලාංකිකයන්ට විධායක සහ පරිපාලන කටයුතු පිළිබඳව පුහුණුවක් ලබා දෙනු ලැබීය.
E - මහ ලේකම්වරයාට අනාරාධිතව විධායක කාරක සභා රැස්වීම්වලට සම්බන්ධ වීමට ඉඩ ලබාදෙනු ලැබීය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

23. 1947/1948 සෝල්බරි ආණ්ඩු ක්‍රමය මගින්,
A - අර්ධ ස්වාධිපති බලය සහිත ව්‍යවස්ථාදායකයක් ඇති කළේය.
B - වෙස්ට්මිනිස්ටර් ආකෘතියේ ලක්ෂණ සහිත ආණ්ඩුක්‍රමයක් ඇති කළේය.
C - ප්‍රථම වරට සමතුලිත බලයක් සහිත ද්විමාණ්ඩලික වාදයක් ඇති කළේය.
D - ව්‍යවස්ථා විවරණ බලය සීමිත සහ අප්‍රකාශිත ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයට පවරනු ලැබීය.
E - අවසාන අභියාචන බලය ලංකාවෙන් පිටත අධිකරණයකට පවරනු ලැබීය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

24. 1972 පළමු ජනරජ ආණ්ඩු ක්‍රමය මගින්,
A - ජනතා පරමාධිපත්‍ය බලයට කේන්ද්‍රීය වැදගත්කමක් ලබා දුන්නේය.
B - වෙස්ට්මිනිස්ටර් රාජාණ්ඩුක්‍රමය වෙනුවට වෙස්ට්මිනිස්ටර් සමූහාණ්ඩු ක්‍රමයක් ඇති කළේය.
C - ස්ථිර විධායකය පාලනය කිරීමේ බලය සත්‍ය විධායකයට ලබා දුන්නේය.
D - සිංහල භාෂාව මෙන්ම දෙමළ භාෂාව ද රාජ්‍ය භාෂා බවට පත් කළේ ය.
E - ප්‍රථම වරට සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීමේ අරමුණ සහිත රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්මයක් ඇති කළේය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

[හයවැනි පිටුව බලන්න]

25. ශ්‍රී ලංකාවේ පැවැති ආණ්ඩු ක්‍රමයන්හි සිදුකළ කාර්යයන් සමඟ නිවැරදිව ගැළපෙන කාණ්ඩය වන්නේ,

A - 1910 කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය - සීමිත ඡන්දබලය හඳුන්වා දීම
B - 1920 මැනිං ප්‍රතිසංස්කරණය - පළාත් බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම
C - 1924 මැනිං ඩෙවෝන්ෂයර් ප්‍රතිසංස්කරණය - බලය සහ වගකීම එකිනෙකට වෙන් කිරීම
D - 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය - වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් හඳුන්වා දීම
E -1947/1948 සෝල්බරි ආණ්ඩු ක්‍රමය - අනාගාමික රාජ්‍ය ස්වරූපයෙන් ඉවත්වීම

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන **(1), (2), (3),(4)** සහ **(5)** යන වරණවලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 26. | 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කැබිනට් ඇමතිවරු පාර්ලිමේන්තුවට වගකීමට මෙන් ම උත්තර දීමට ද බැඳී සිටිති. | 1978 ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලයේ නායකයා වුව ද පාර්ලිමේන්තුවට වගකීමට මෙන්ම උත්තර දීමට ද බැඳී නැත. | (....) |
| 27. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනතා පරමාධිපත්‍ය බලයේ ප්‍රකාශනයක් ලෙස පරිපූර්ණ මූලික අයිතිවාසිකම් ප්‍රකාශනයක් හඳුන්වා දී ඇත. | 1978 ව්‍යවස්ථාවේ 126 වගන්තියට අනුව මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ තනි සහ අනන්‍ය බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ලබා දී ඇත. | (....) |
| 28. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද 19 වන සංශෝධනය මගින් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව සම්මත නොකළ පනත් ජනමත විචාරණයකට යොමු කළ හැකි විය. | 19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව ජන මත විචාරණයකදී ජනතාව බහුතර කැමැත්තෙන් සම්මත කළ පනත් නීතියක් බවට පත්වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසිනි. | (....) |
| 29. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 20 වන සංශෝධනය මගින් පාර්ලිමේන්තුවේ උපරිම විශ්වාසය දිනා ඇතැයි සිතන මන්ත්‍රීවරයා අගමැති ලෙස පත්කිරීමටත් අභිමත ලෙස අගමැති ඉවත් කිරීමටත් ජනාධිපතිට බලය ලබා දී ඇත. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 21 වන සංශෝධනය මගින් ශ්‍රී ලංකාවට අමතරව තවත් රටක පුරවැසිභාවය සහිත පුද්ගලයකුට පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධූර දැරීමට ඉඩ ලබාදී නැත. | (....) |
| 30. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා විසින් සෑම මසකට වරක්වත් පාර්ලිමේන්තුව කැඳවිය යුතුය. | 1978 ව්‍යවස්ථාවට අනුව මාස දෙකක් නොඉක්මවන කාලයක් සඳහා පාර්ලිමේන්තුව වාර අවසාන කිරීමට ජනාධිපතිට බලය ඇත. | (....) |

**B** කොටස

31. දේශපාලන විද්‍යා අධ්‍යයනයේ දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශය ඉදිරිපත් කළ පුරෝගාමීන් **දෙදෙනා** නම් කරන්න.

(1) ..............................................................................................................................
(2) ..............................................................................................................................

32. විසිවන සියවසේ දී දේශපාලන පක්ෂවල කාර්යභාරය තහවුරුවීමට හා වර්ධනය වීමට බලපෑ හේතු **දෙක** ලියන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

33. (1) දේශපාලනමය වශයෙන් සචේතනික ප්‍රථම රාජ්‍ය මාදිලිය කුමක්ද?

..............................................................................................................................

(2) පුරවැසියා වෙනුවට 'යටත්වැසියා' (Subject) යන සංකල්පය පැවති රාජ්‍ය මාදිලිය කුමක් ද?

..............................................................................................................................

34. ඒකීය රාජ්‍යයන් හි මධ්‍යයේ සිට පහළ මට්ටම්වලට පරිපාලන බලය විසුරුවා හැරීම ප්‍රධාන ආකාර තුනකින් සිදුවේ. ඉන් දෙකක් නම් කරන්න.

(1) ..............................................................................................................................
(2) ..............................................................................................................................

35. ශ්‍රී ලංකා දේශපාලනයේ සභාග ආණ්ඩු බිහිවීමට බලපා ඇති සාධක **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................................
(2) ..............................................................................................................................

36. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ අමාත්‍ය මණ්ඩලය කොටස් දෙකකින් සමන්විත විය. එම කොටස් **දෙක** නම් කරන්න.

(1) ..............................................................................................................................
(2) ..............................................................................................................................

37. (1) නීතිය මත රාජ්‍ය පදනම් විය යුතුය යන 'නෛතික රාජ්‍ය' (Rechtsstaat) සංකල්පය ගොඩනැගුණේ කුමන රාජ්‍ය කේන්ද්‍ර කරගෙන දැ'යි නම් කරන්න.

..............................................................................................................................

(2) 'මිනිසුන්ගේ පාලනය නොව නීතියේ පාලනය' (Rule by law, not by men) පැවතිය යුතු බව යන අදහස ඉදිරිපත් වූයේ කුමන රාජ්‍ය කේන්ද්‍ර කරගෙනද?

..............................................................................................................................

38. ගැටුම් පරිවර්තනය ආකාර කිහිපයකින් සිදු කළ හැකිය. ඉන් **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................................................
(2) ..............................................................................................................................

39. අන්තර්ජාතික සමාජය තුළ රාජ්‍යයන් ස්වකීය ජාතික අභිලාෂ (National Interest) මුදුන්පත් කරගැනීමට භාවිතා කරන උපායමාර්ග **දෙකක්** ලියන්න.

(1)..............................................................................................................................

(2)..............................................................................................................................

40. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමයේ නාමික විධායකය හා 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමයේ නාමික විධායකය හැඳින් වූ ආකාර **දෙක** පිළිවෙලින් නම් කරන්න.

(1) ..........................................................................................................
(2) ..........................................................................................................

41.(1). 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමයට අනුව පාර්ලිමේන්තුවේ සාමාජිකයන් 225ක් බවට පත්කරන ලද්දේ කුමන ව්‍යවස්ථා සංශෝධනය මගින්ද?

..........................................................................................................

(2). 1978 දෙවැනි ජනරජ ආණ්ඩුක්‍රමයට අනුව ජනාධිපතිවරයා වෙත ලබාදෙන මුක්තියේ විෂය පථය සිවිල් හා අපරාධ ක්‍රියාවන්ට පමණක් සීමා කරන ලද්දේ කුමන ව්‍යවස්ථා සංශෝධනය මගින්ද?

..........................................................................................................

42. ශ්‍රී ලංකාවේ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමයට අනුව නීති සම්පාදනය කළ හැකි ආකාර **දෙකකි.** නම් කරන්න.

(1) ..........................................................................................................
(2) ..........................................................................................................

43. ස්විට්සර්ලන්තයේ ආණ්ඩුක්‍රමය තුළ පවතින ප්‍රධාන ව්‍යවස්ථානුකූල සිද්ධාන්තයන් **දෙක** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

44. රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ව්‍යවස්ථාදායක බලය අඩු වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................
(2) ..........................................................................................................

45. ජෝන් ලොක් මානව අයිතිවාසිකම්වල වපසරිය කොටස් තුනකට සීමා කර ඇත. ඉන් **දෙකක්** නම් කරන්න.

(1)..........................................................................................................
(2)..........................................................................................................

46. ගැටුම සමග වැඩ කිරීම (Working with Conflict) කෘතිය හා ජාත්‍යන්තර ගැටුම්වල ව්‍යුහය (The Structure of International Conflict) කෘතිය රචනා කළ න්‍යායවේදීන් **දෙදෙනා** පිළිවෙලින් නම් කරන්න.

(1) ..........................................................................................................
(2) ..........................................................................................................

47. 18 වන සියවසේ දී සමූහාණ්ඩුවාදය වර්ධනය කළ ප්‍රංශ හා ඇමරිකානු චින්තකයින් **දෙදෙනෙකු** පිළිවෙලින් නම් කරන්න.

(1)..........................................................................................................
(2)..........................................................................................................

48. සහ සන්ධීය ආණ්ඩු ක්‍රමයක් ක්‍රියාත්මක වන රටවල් **දෙකක්** නම් කරන්න.

(1)..........................................................................................................
(2)..........................................................................................................

49. අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන අතර ආරක්ෂක බල සංවිධානයක් හා ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට බිහිකර ගත් සංවිධානයක් පිළිවෙලින් ලියන්න.

(1) ..........................................................................................................
(2) ..........................................................................................................

50. දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝක බල තුලනය ද්විධ්‍රැවීකරණයට ලක් විය. එම ආස්ථානයන්ට නායකත්වය දුන් රටවල් **දෙක** නම් කරන්න.

(1)..........................................................................................................
(2)..........................................................................................................

***

PAST PAPERS WIKI

Past Papers Wiki



සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Sabaragamuwa Provincial Department of Education**
சபரகமுவ மாகாணக் கல்வி திணைக்களம்

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය -2026
## තෙවන වාර පරීක්ෂණය

දේශපාලන විද්‍යාව I I
அரசியல் விஞ்ஞானம் I I
Political Science I I

23 | S | I I

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

පැය තුනයි 03
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதி வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස් :**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විතය.

* **I** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, **II** කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, **III** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

### I කොටස

1. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමට භාවිතා කරන පහත සඳහන් අධ්‍යයන ප්‍රවේශ අතුරින් **දෙකක්** සාකච්ඡා කරන්න.

    (i). දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශය

    (ii). බහු විෂයක ප්‍රවේශය

    (iii). දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය

    (iv). ස්ත්‍රීවාදී ප්‍රවේශය (ලකුණු 10×2 = 20)

2. (i). නූතන රාජ්‍යයන් ඉටුකරන කාර්යයන් **පහක්** නම් කරන්න. (ලකුණු 05)

    (ii). රාජ්‍ය පිළිබඳ සමාජ සම්මුතිවාදී න්‍යාය පැහැදිලි කරන්න. (ලකුණු 15)

3. පහත සඳහන් දේශපාලන මතවාදවලින් **දෙකක්** විස්තර කරන්න.

    (i). සමාජවාදය

    (ii). සමූහාණ්ඩුවාදය

    (iv). ජාතිකවාදය

    (v). පැසිස්ට්වාදය (ලකුණු 10×2 = 20)

## II කොටස

4. "1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය ලංකා දේශපාලන ඉතිහාසය නව මහකට විවර කරන ලදී ". පැහැදිලි කරන්න.

(ලකුණු 20)

5. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමයේ සුළු ජාතික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන තිබූ විධිවිධාන සහ ඒවායේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

6. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාවේ ඇති කළ පහත සඳහන් අංග අතුරින් **දෙකක්** විස්තර කරන්න.

(i). මූලික අයිතිවාසිකම් ප්‍රකාශනය

(ii). ජනාධිපති ධූරය

(iii). ජාතික රාජ්‍ය සභාව (ලකුණු 10×2 = 20)

7. 1978 ආණ්ඩු ක්‍රමයේ පහත සඳහන් මාතෘකා **දෙකක්** සාකච්ඡා කරන්න.

(i). ජනාධිපති සහ පාර්ලිමේන්තුව

(ii). ජනාධිපති සහ කැබිනට් මණ්ඩලය

(iii). ඔම්බුඩ්ස්මන්ධූරය

(iv). 19 වන ව්‍යවස්ථා සංශෝධනය (ලකුණු 10×2 = 20)

## III කොටස

8. (i). ඉන්දීය ආණ්ඩු ක්‍රමය අර්ධ සන්ධිය ආණ්ඩු ක්‍රමයක් වේ. එහි දක්නට ලැබෙන සන්ධිය ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii). ප්‍රංශයේ පරිපාලන බලය විමධ්‍යගත කර ඇති ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

9. (i). ශ්‍රී ලංකාවේ විදෙස් ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු සාධක **පහක්** නම් කරන්න. (ලකුණු 05)

(ii). ශ්‍රී ලංකාවේ විදෙස් ප්‍රතිපත්තියේ සමකාලීන ප්‍රවනතා හඳුන්වන්න. (ලකුණු 15)

10. පහත සඳහන් මාතෘකා **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i). මැදිහත්කරණය

(ii). සිවිල් සමාජය

(iii). ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂවල නව ප්‍රවනතා

(iv). රාජ්‍ය ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාදායකය

(v). බලතල බෙදීම (ලකුණු 10×2 = 20)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දේශපාලන විද්‍යාව - 13 ශ්‍රේණිය

තෙවනවාර පරීක්ෂණය - 2026

පිළිතුරු පත්‍රය

**1 පත්‍රය**

**A කොටස**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|
| 01 | **5** | 11 | **5** | 21 | **4** |
| 02 | **3** | 12 | **4** | 22 | **5** |
| 03 | **2** | 13 | **1** | 23 | **3** |
| 04 | **5** | 14 | **2** | 24 | **2** |
| 05 | **4** | 15 | **3** | 25 | **1** |
| 06 | **2** | 16 | **4** | 26 | **2** |
| 07 | **3** | 17 | **4** | 27 | **5** |
| 08 | **5** | 18 | **2** | 28 | **4** |
| 09 | **1** | 19 | **5** | 29 | **1** |
| 10 | **4** | 20 | **3** | 30 | **3** |

**B කොටස**

31. 1. ප්ලේටෝ
    2. ඇරිස්ටොටල්

32. 1. නියෝජන ආණ්ඩු ක්‍රමය ව්‍යාප්ත වීම
    2. ඡන්ද බලය ව්‍යාප්ත වීම

33. 1. ග්‍රීක නාගරික රාජ්‍ය මාදිලිය
    2.රාජාණ්ඩු රාජ්‍ය මාදිලිය

34. 1. බලය විතැන් කිරීම
    2. පරිපාලනය විමධ්‍යගත කිරීම
    3. බලය පැවරීම

35. 1. සමානුපාතික නියෝජන ක්‍රමය
    2. බහු පක්ෂ ක්‍රමය
    3. සංකීර්ණ සමාජයක් පැවතීම

36. 1. විධායක කාරක සභ සභාපතිවරු 7 (දේශීය අමාත්‍යවරු 07)
    2. රාජ්‍ය නිළධාරීන් තිදෙනා

37. 1. ජර්මනිය
    2. ඇමරිකා එක්සත් ජනපදය

38. 1.පාර්ශ්වකරුවන් පරිවර්තනයට පත් වීම
    2. නිමිති හා න්‍යාය පත්‍රවල පරිවර්තනය
    3. ගැටුමේ නීතිරීති පරිවර්තනය
    4. ව්‍යුහමය පරිවර්තනය

39. 1. රාජතාන්ත්‍රික සබඳතා
    2. විදේශ ප්‍රතිපත්තිය

3. ප්‍රචාරණය
4. ආර්ථික උපාය මාර්ග
5. සන්ධානගත වීම් හා ගිවිසුමගත වීම්
6. යුද බලය

40. 1.අග්‍රාණ්ඩුකාරවරයා
2. නාමික ජනාධිපති

41. 1. 14 වන ව්‍යවස්ථා සංශෝධනය
2. 19 වන ව්‍යවස්ථා සංශෝධනය

42. 1. පාර්ලිමේන්තුව මගින්
2. ජනමත විචාරණ මගින්

43. 1. හවුල් පාලනය
2. ස්වයං පාලනය

44. 1. දේශපාලන පක්ෂ ක්‍රමයේ වර්ධනය
2. සමාජීය ප්‍රශ්න සංකීර්ණ වීම
3. ප්‍රතිපත්ති හුවා දැක්වීම පමණක් සිදු කිරීම

45. 1. ජීවිතය
2. නිදහස
3. දේපළ

46. 1.සයිමන් ෆිෂර්
2. ක්‍රිස්ටෝපර් මිචෙල්

47. 1. රූසෝ/චාල්ස් මොන්ටෙස්ක්‍යු
2. තෝමස් ජෙෆර්සන්/ ජේම්ස් මැඩිසන්

48. 1. ස්විට්සර්ලන්තය
2. එක්සත් අරාබි එමීර් රාජ්‍ය

49. 1. උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (NATO)/ වෝර්සෝ සංවිධානය
2. බ්‍රෙට්න්වුඩ්ස් සංවිධානය/ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ලෝක බැංකුව

50. 1.සෝවියට් දේශය
2. ඇමරිකා එක්සත් ජනපදය